


සිසිර දිසානායක

# 125- පාදුක්කට ට්‍රෑම් ?




"125 පාදුක්ක රූට් එකේ ට්‍රෑම් බසුත් දුවනවද?"

නින්දෙන් නොනින්දෙන් වගේ ගේලන් වේවර්ලි කෝච්චියේ ඇලවෙලා උන්නු පින්සල ගැස්සිලා ඇහැරිලා වටපිට බැළුවා. කෝච්චිය කූයෝං ස්ටේෂන් එකට කලින් හම්බවෙන ගේලන් ෆෙරී පාර පහු කරමිනුයි තිබුණේ. කෝච්චිය යනකල් ග්ලෙන් ෆෙරී පාරේ නවත්තගෙන උන්නු මාර්ග අංක 125 දුවන ට්‍රෑම් එක දැකලයි පින්ට එක පාරටම තමන් ඉන්නේ ගම් පලාතට යන බස් එකක වගේ දැනුණේ. "හරියටම හයිලෙවල් පාරේ ගොඩගම හන්දිය වගේ " පින් හිත හදගත්තා. පුදුමයක් යැ? දවස් දෙකකට කලින් උන්නේ එහෙනේ.

"හොඳටම නින්ද ගියා නේද? ඉස්සරහ ආසනේ ඉදං උන්නු "ක්‍රිස් " පින්ගෙන් ඇහුවේ ආසනේ පින් අයෙමත් ඇස් දෙක පිහදලා බැලුවා. "සුදු ජාතිකයෙක් සිංහලෙන් කතා කරනවා ... කීස්බරෝ පන්සලේ දහම් පාසලේ උගන්නපු නවසීලන්තයේ උපන්න ක්‍රිස් ක්ලේග්

"මතකද ද මාව ... ? මෙන්න කාඩ් එක. මට කථාකරන්න. මං කූයෝං වලින් බහිනවා. ආය හමුවෙමු... " ක්‍රිස් කෙටි කෙටි වාක්‍ය වලින් අපුරුවට සිංහල කතාකලා.

"ඇයි මතක නැද්ද රුද්‍රා ...? චෛත්‍ය හදන දවස්වල කරගහගෙන උදව් කලේ ?

***<u>පුවත්පත් කලාව හා බැඳී ආ කාටුන් සහ 'විහිළු' මුල් කොටගත් චිත්‍ර එදිනෙද පුවත්පත්වලට පවා "නැතිවම බැරි" අංගයක් ව ඇත්තේය. එද මෙද තුර ඒ වෙනුවෙන්ම කැප වූ, ඒ නිසාම ජනප්‍රිය වූ ශිල්පීන් පිරිසක් ද වෙත්.</u>***

සිංහල අපට වඩා හොඳට සිංහල කතා කරවා. සිඩ්නිවල කල්‍යාණි ... ? පින් පන්හිඳ එක්ක ක්‍රිස් ගැන ගෙදර ආව ගමන් කිව්වම පන් නම් වැලක් කියාගෙන ගියා. අපේ උන්දලාට අගේ නැති වුණාට ඒ අය ද්‍රවිඩ ජාතිකයෝ වෙලත් සිංහල අමතක කරන්නේ නෑ. පසුගිය පාර සිඩ්නි ගියාම එහේ ඉන්න තීරණය කලේ ඒ හන්දමයි... " පන් තීන්ත කුප්පිය හෙව්වේ මොනව හරි ලියන්න හිතාගෙන වගේ.

තවමත් කෝච්චියේ සිහියෙන් උන්නු පින්ට ඒ කාලේ කියවපු කවියක් මතක් වෙලා තාලෙක කියවුණා.

"පුංචි කෝච්චිය යයි හරි වේගෙන්
පැය හතරට එක හැතැප්ම වේගෙන්
කෙල්ලයි කොල්ලයි නැග්ගම කොටුවෙන්
දරුවෙක් බිහිවෙයි ඕපනායකින්

රතුකොඩි " කොළ කොඩි ගාඩ් වනන්නේ
අනේ මුන්ට මොන දේශපාලනේ
වේයන්ගෙඩ ඇයි නතර කරන්නේ?
දේශපාලනේ " දේශපාලනේ ... "

එක්දස් නවසිය හැට ගණන්වල විතර " රිවිරැස" පත්තරේක "නරලොව හොල්මං" තීරයට චන්ද්‍ර අනගිරත්න මහත්තයා ලියපු කවි පෙළක කවි දෙකක් ඔය.

සිංහල ගැන මොනව හරි ලියන්න වාඩි වුණා . පන්ගේ හිත කවිය අහලා කරකවලා අතඇරපු බඹරයක් වගේ වුණා. උපහාස කලාව... සිංහල භාෂාවේ හොඳ අංගයක් තමා උපහාසය. හැබැයි අපහසාය නෙවි. ඒක වෙනම එකක්. බඹර කරකැවිලා නතර වුණා. හිත දැන් එකලස්.

"උපහාසය අපගේ සිංහල සාහිත්‍යාංගයක් බවට පත් වුයේ මෑතකදී නොවේ. රජ දවස් ජීවත් වුවා යැයි ප්‍රවාදයේ එන්නා වු 'අන්දරේ' නම් වූ කවටයා වටා ගෙතුණා වු උපහාස සාහිත්‍ය කලාව එක් නිදසුනකි. අන්දරේ ගේ බොහෝ කවි හා කතාවන්හි ගැබ්වන්නේ කවටකම් ඉස්මතු වන අරුත් වුවද ඉන් බොහෙ-ාමයක උපහාසය ද සියුම් ලෙස කැටිව ඇත්තේය.

පොදුවේ ගත්කල අපගේ මුළු මහත් ජන කලාවන්හිම ඒ ඒ පමණට උපහාසය කැටිව ඇත්තේය.

මාමයි මමයි වැලි කුඹුරේ නානකොට
දත්කොට ඇතෙක් එනවා අපි මරන්නට
වටපිට බැලීම් ගසකුත් නැත නගින්නට
පිට පට ගසා පැන්නෙමි මාමගේ කරට

තවත් ජනප්‍රිය කවියකි මේ.

කවුදැයි කවුදැයි රණ්ඩු කරන්නේ ?
නැන්දයි මාමයි රණ්ඩු කරන්නේ ?
මන්දැයි මන්දැයි රණ්ඩු කරන්නේ ?
දුං කොළ නැට්ටට රණ්ඩු කරන්නේ?

පසු කලෙක අපගේ සාහිත්‍යයට එක්වුන කවි" කතා අතර විදත් කතුවරු පවා උපහාසයට ඇසුරින් සමාජයේ දූර්වල තැන් ඉස්මතු කරලීමට උත්සාහ කළහ. නිරන්තරයෙන් උපහාසයට හාස්‍ය එක්වුයේ යමෙකුගේ සිත නොරිදවා එකී තැනැත්තාගේ දූර්වලකම් හුවා දැක්වීමට සුදුසුම අංගයක් වශයෙනි. කුමාරතුංග මුණිදස ශූරීන් විසින් රචිත "හත්පණ" වැනි ළමා සාහිත්‍යය පෝෂණය කළ කෘතිවල පවා උපහාසය කැටි විණ.

***<u>වසර 1960 දී පමණ ගුවන් විදුලියෙන් ඇරඹුන විකට වැඩසටහක් වු "විනෝද සමය" ද නිසි ඇගයීමකට ලක් නොවු අගනා උපහාසාත්මක නිර්මාණයකි.</u>***

පුවත්පත් කලාව හා බැඳී ආ කාටුන් සහ 'විහිළු' මුල් කොටගත් චිත්‍ර එදිනෙද පුවත්පත්වලට පවා "නැතිවම බැරි" අංගයක් ව ඇත්තේය. එද මෙද තුර ඒ වෙනුවෙන්ම කැප වූ, ඒ නිසාම ජනප්‍රිය වු ශිල්පීන් පිරිසක් ද වෙත්. ඒ ඒ වකවා-නුවලි රටේ පවතින දේශපාලන, ආගමික, සමාජයීය වටපිටාවක් ඇසුරින් ලියැවුණ උපහාසත්මක පුවත් පත් ලිපි අතරින් චන්ද්‍රා අනගිරත්නයන් සම්පාදනය කළ ලිපි පුරෝගාමී මෙහෙවරක යෙදුණා යැයි සඳහන් කිරීම අභියෝගාත්මක වුවද එය සත්‍යයකි. සැබැවින්ම අනගිරත්නයන් සතුවු පෘථුල දැනුම ඉතා සරළව ඇතැම් විටෙක ග්‍රාම්‍ය ලෙසින් ලියැවුණු වු එකී ලිපිවලින් පිලිඹිබු විණ. එකී හැකියාව පළකල ලිපි සම්පාදකවරුන් අද වනතුරුත් පහළ වුණාදැයි සැක සහිතය. පහළ විණි නම් නිර්මාණාත්මක හැකියාවක් ඇත්තවුන් වෙනුවට ඒ අනුගමනය කරන්නන් පිරිසක් පමණකි. ඉහත ලියැවුණ නම් දෙක අනගිරත්නයන්ගේ උපහාස කලාවට "අනගි" නිදසුනකි.

වසර 1960 දී පමණ ගුවන් විදුලියෙන් ඇරඹුන විකට වැඩසටහක් වු "විනෝද සමය" ද නිසි ඇගයීමකට ලක් නොවු අගනා උපහාසාත්මක නිර්මාණයකි. ඇනස්ලි ඩයස්, සැමුවෙල් රොද්‍රිගෝ, බර්ටි ගුණතිලක , ධර්ම ශ්‍රී මුණසිංහ, ස්වර්ණා ශ්‍රී සරත්වීර ශිල්පීන් සමඟින් ශ්‍රී ලංකාවට ගුවන් විදුලි විකට වැඩසටහන් හදුන්වා දෙන ලද්දේ එච්. ඩී. විජේදස මහත්මායි. අප අතරින් වියෝ වු සැමුවෙල් රොද්‍රිගු මහතාගේ "අමාරිස් අයියා " ග්‍රන්ථයේ දෙබසකි මේ (පිටුව 58)

**අමාරිස්** : ලේසියෙන් කෙනෙකුට ගෙයක් දෙන්ඩ එපා

**හාමු** : කොහොමද අමාරිස් අයියේ මිනිස්සු තේරුම් ගන්නේ ?

**අමාරිස්** : ඇයි අහලා නැද්ද? ඕකට තියෙනවා ශාස්ත්‍රයක්

**හාමු** : අම්මපා ? මං දන්නැහැනේ. මොක-ක්ද ශ්‍රාස්ත්‍රෙ?

**අමාරිස්** : ගෙවල් කුලී මාලේ කවි... ඔන්න අහගන්න.

තුනටිය නව නවා ගේ ඉල්ලන්නේ
ඇරියස් කියලයි කුලිය ගෙවන්නේ
ඔලුව නව නවා ගේ ඉල්ලන්නේ
යනවා කිය කියා ගෙයිම ලගින්නේ
දෙකට නැමීලයි ගේ ඉල්ලන්නේ
කවදවත් ඔහු ගෙයින් නොයන්නේ

**හාමු** : අම්මපා අමාරිස් අයියගේ කටේ දන්ඩ වටිනවා.....

**අමාරිස්** : මොකුත් දන්න එපා.... තව කතා කරන්න තියෙනවා ....

"තව ලියන්න තියෙනවා..." පන් දුරකථනයට උත්තර දුන්නා.

"ඔය ලියපු ටික එවන්න, පස්සේ අයේ ඔය ගැන ලියමු. පරක්කු වෙලා ... දුරකථනය එහා පැත්තේ අසෝක සුබසිංහ කර්තෘ මහත්තයා

"ඇත්ත තමා ලියන්න ගියාමත් කියවන්න ගත්තම වගේ තමා. අහන අය, කියවන අය, කෝච්චියට අහුවුණා වගේ වෙනවා. පින් ආයෙමත් "කෝච්චි" කතාවක් ගත්තා.

"තමුන්නැහේගේ හිත තාම කෝච්චියේ. මොකද දන්නෑ.. පන් උපහාසයෙන් හිනා වුනා.

සන්නස අන්තර්ජාලයෙන්
www.sannasa.net

